# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

# රැකියා අවස්ථා

සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකාව තුළ මීගමුව සිට ගාල්ල දක්වා මුහුදුබඩ තීරයේ පාරිභෝගිකයින් 650,000 ට වැඩි සංඛ්‍යාවකට සේවා සළසන මෙහෙයුම් ප්‍රදේශ ආවරණය කෙරෙන ශාඛා හතකින් සමන්විත බෙදාහැරීමේ උපයෝගීතාවයකි. 1500 ක සේවක සමූහයක් සහිත සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පිරිස් වෙතින්, ආසියානු සංවර්ධන බැංකු (ADB) අරමුදල් යටතේ, විදුලිබල පද්ධති සවිබල ගැන්වීමේ හා ප්‍රතිජනනීය බලශක්ති ඒකීකරණ ව්‍යාපෘතියෙහි පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවේ.

## 1. ව්‍යාපෘති ගණකාධිකාරක (ඇබෑර්තු 01කි)

| | |
|---|---|
| **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** | (1) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) ආශ්‍රිත සාමාජිකත්වය – හෝ –<br>(2) එක්සත් රාජධානියේ (UK) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය –හෝ–<br>(3) එක්සත් රාජධානියේ (UK) වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) සාමාජිකත්වය –හෝ–<br>(4) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය/ මුදල්/ බී කොම්/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් සහ CA/CIMA/ACCA අන්තර් මධ්‍ය විභාගය. |
| **පළපුරුද්ද** | * 100 කට වැඩි සේවක සංඛ්‍යාවක් සහිත ආයතනයක ගිණුම්කරණ/ විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද – මෙම පළපුරුද්ද ගිණුම් විධායක තනතුරකට සමාන වේ.<br>* රජයේ හෝ පෞද්ගලික අංශයේ ව්‍යාපෘති මූල්‍යකරණය, විගණනය, රක්ෂණ ඔප්පු, LC හැසිරවීම ස්ථාවර කොන්ත්‍රාත් නියමයන් සහ බිල්කිරීමේ ක්‍රියාදාමය හා ලංසුකරණ ක්‍රියාදාමය පිළිබඳ වෘතීය පළපුරුද්ද සහ පහත සඳහන් විදුලිබල, ටෙලිකොම්, පාරිසරික යටිතල පහසුකම්, ජලය හා අපජලය හා ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වලින් අඩුතරමින් එකක්වත් වැඩ කිරීමේ පළපුරුද්ද අගය එකතු කළ සුදුසුකමක් ලෙස සැලකේ. |
| **වෙනත් සුදුසුකම්** | * ඉංග්‍රීසි භාෂාවෙහි කැපී පෙනෙන වාචික හා ලිඛිත සංනිවේදන නිපුණතා.<br>* බලෝත්පාදක පරිසරයක තියුණු ප්‍රතිඵල සපුරාලීමෙහි නියැළි කණ්ඩායමක් තුළ සහයෝගීව කටයුතු කිරීමේ දැඩි හැකියාව.<br>* ස්වාධීනව වැඩ කිරීමට, මූලිකත්වය දැරීමට, ප්‍රමුඛතා සකස් කිරීමට සහ ව්‍යාපෘති සාර්ථකව නිමා කිරීමට හැකියාසහිත ස්වයං ගාමක වීම. |

## 2. ව්‍යාපෘති සහකාර සහ පරිපාලන නිලධාරී (ඇබෑර්තු 01 ක්)

| | |
|---|---|
| **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** | ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකමක් |
| **පළපුරුද්ද** | * අඩුතරමින් වසර 02 ක තනතුරට අදාළ විශේෂිත පළපුරුද්ද<br>* ව්‍යාපෘති සහායක සහ ව්‍යාපෘති පරිපාලනය පිළිබඳ අත්පිට පළපුරුද්ද ඇතුළුව රජයේ හෝ පෞද්ගලික අංශයේ අඩුතරමින් වසර 04 ක අදාළ වෘත්තීය පළපුරුද්ද<br>* පහත සඳහන් අධ්‍යාපන, විදුලිබල, ටෙලිකොම්, පාරිසරික යටිතල පහසුකම්, ජලය හා අපජලය සහ ප්‍රවාහණය යන ක්ෂේත්‍ර වලින් අඩුතරමින් එකකවත් වැඩ කිරීමේ පළපුරුද්ද |
| **වෙනත් සුදුසුකම්** | * ඉංග්‍රීසි භාෂාවෙහි විශිෂ්ට වාචික හා ලිඛිත සංනිවේදන නිපුණතා<br>* වාර්තා සමාලෝචනය කිරීමේ විශිෂ්ට නිපුණතා සහ ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ අනුගමනය.<br>* බලෝත්පාදක පරිසරයක තියුණු ප්‍රතිඵල සපුරාලීමෙහිලා කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව.<br>* ස්වාධීනව වැඩ කිරීමට, මූලිකත්වය දැරීමට, ප්‍රමුඛතා සකස් කිරීමට සහ ව්‍යාපෘති සාර්ථකව නිමා කිරීමට හැකියාව.<br>* බහු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට නිරවද්‍ය වාර්තා නඩත්තු කිරීමට හා පහසු ව්‍යාපෘති මෙහෙයුම් සහතික කරලීමට හැකියාව.<br>* ව්‍යාපෘති පරිපාලනයට අදාළ ප්‍රසම්පාදන හා අනකුත් ලිපිලේඛන කටයුතු සඳහා සහාය වීම.<br>* ව්‍යාපෘති යාවත්කාලීන කිරීම සඳහා ලිපි කටයුතු සකස් කිරීම, වාර්තා පිළියෙළ කිරීම සහ පැහැදිලි ලිපිලේඛන කටයුතු නඩත්තු කිරීම. |

## 3. සමාජ හා පාරිසරික නිලධාරී (ඇබෑර්තු 01 කි)

| | |
|---|---|
| **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, ජෛව විද්‍යාව, පාරිසරික විද්‍යාව/ කළමනාකරණය, සමාජ විද්‍යාව/ කළමනාකරණය, ව්‍යවහාරික විද්‍යාව හෝ වෙනත් ඕනෑම අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකම්. |
| **පළපුරුද්ද** | * තනතුරට අදාළ අඩුතරමින් වසර 03 ක විශේෂිත පළපුරුද්ද – හෝ –<br>* පරිසරය, බලශක්තිය සහ සමාජ ආරක්‍ෂාව ක්ෂේත්‍රයන් පිළිබඳව රජයේ හෝ පෞද්ගලික අංශයේ අඩුතරමින් වසර 06 ක අදාළ වෘත්තීය පළපුරුද්ද –හෝ–<br>* විදුලිබල, ටෙලිකොම්, පාරිසරික යටිතල පහසුකම්, ජලය හා අපජලය සහ ප්‍රවාහනය යන ක්ෂේත්‍රයන්ගෙන් අඩුතරමින් එකක හෝ වැඩකර පළපුරුද්ද. |
| **වෙනත් සුදුසුකම්** | * පාරිසරික සංඝට්ටන තක්සේරුවට අදාළ තාක්‍ෂණ සේවා ලබාදීමේ සහ ජාතික හා අන්තර්ජාතික මාර්ගෝපදේශ පරිදි සැහැල්ලු කිරීමේ පියවර අධීක්‍ෂණය, යෝජනා කිරීම හා ක්‍රියාත්මක කිරීම.<br>* ව්‍යාපෘති පාරිසරික හා සමාජ ආරක්‍ෂණයට අදාළ ක්‍රියාකාරකම් හැසිරවීමේ හැකියාව.<br>* බලෝත්පාදක පරිසරයක තියුණු ප්‍රතිඵල සපුරා ලීමෙහි ලා කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව.<br>* පාරිසරික හා සාමජ ආරක්‍ෂණයට අදාළ ක්‍රියාත්මක කිරීමේ ගැටලු ඵලදායී ආකාරයට විශ්ලේෂණය කොට විසඳීම.<br>* මනා මහජන සබඳතා නිපුණතා.<br>* පරිගණක සාක්ෂරතාව<br>* මනා සන්නිවේදන හැකියාව<br>* ඉංග්‍රීසි ලිඛිත හා කථන පිළිබඳ උසස් මට්ටමේ නිපුණතාව. |

## 4. ගිණුම් සහකාර – (ඇබෑර්තු 01කි)

| | |
|---|---|
| **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** | අ.පො.ස (උසස් පෙළ) එක් වරකදී විෂයයන් තුනකින් සමත්වීම. |
| **පළපුරුද්ද** | 1. පහත සඳහන් සුදුසුකම් වලින් එකක්<br>1.1 CIMA මෙහෙයුම් මට්ටම හෝ<br>1.2 HND (ගිණුම්කරණය) 02 වන වසර හෝ<br>1.3 ACCA ව්‍යවහාරික හෝ<br>1.4 ශ්‍රී ලංකා CA– ව්‍යාපාර පෙළ 1 වන විභාගය හෝ<br>1.5 (UK) පොත් තබන්නන්ගේ ආයතනයේ අවසාන පරීක්‍ෂණය හෝ<br>1.6 AAT අවසාන පරීක්‍ෂණය හෝ<br>1.7 ශ්‍රී ලංකා CMA අවසාන පරීක්‍ෂණය<br>-සහ-<br>2. සියයකට වැඩි සේවක සංඛ්‍යාවක් සහිත ආයතනයක ගිණුම්කරණය/විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර පහක (05) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද |
| **වෙනත් සුදුසුකම්** | * ගිණුම්කරණ ප්‍රමිතීන්, මූලධර්ම සහ මනා පැවතුම් පිළිබඳ විශිෂ්ට දැනුම<br>* ඉංග්‍රීසි සහ මව්බස යන දෙකෙහිම විශිෂ්ට සංනිවේදන නිපුණතා<br>* පීඩනය යටතේ වැඩකර අවසාන ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව.<br>* ප්‍රබල විශ්ලේෂණාත්මක නිපුණතා, ගැටලු විසඳීමේ නිපුණතා සහ කණ්ඩායමක් ලෙස වැඩ කිරීම යනාදිය. |

**පොදු කොන්දේසි :**

තෝරාගනු ලබන අයදුම්කරුවන් වසර 02 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා පත්කරනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුට, තෝරා ගැනුනු පුද්ගලයාගේ සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව තරගකාරී හා විස්තීර්ණ වැටුප් පැකේජයක් හිමිවේ.

සම්පතම පරිසරයක ගෞරවාන්විතව සමාන අවස්ථාවන් ලබමින් සේවය කිරීමට සියල්ලන්ට ඉඩ සලසාලීම සහතික කරලීම ලංකා විදුලි සමාගමේ බලාපොරොත්තුවයි. සුදුසුකම් සපිරි සියලුම අයදුම්කරුවන්ට ජාතික, ජනවාර්ගික, ආගමික හා සංස්කෘතික පසුබිම, ලිංගභේද, ලිංගික දිශානුයෝජනය හෝ දුබලතා සැළකිල්ලට නොගෙන අයදුම්කරන ලෙස ලංකා විදුලි සමාගම දිරිගන්වයි.

කරුණාකර ඔබගේ සවිස්තරාත්මක ජීව දත්ත සහිත අයදුම්පත් සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සමග 2025 මාර්තු 22 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙන්නට සළස්වන්න.

අයදුම්පතෙහි හා ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කරන්න.

LECO

**අතිරේක සාමාන්‍යාධිකාරී,**
**මානව සම්පත් හා පරිපාලන,**
**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,**
**1 වන මහල, ජී. එච්. කුරේ ගොඩනැගිල්ල, 411, ගාලුපාර, කොළඹ 03.**